සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் **இலங்கைப் பரீட்சைத் திணைக்களம்** இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of **Department of Examinations, Sri Lanka** Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | | | |
|---|---|---|---|
| කෘෂි විද්‍යාව I<br>விவசாய விஞ்ஞானம் I<br>Agricultural Science I | **08** | **S** | **I** |

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** ස්වාභාවික ව ස්වපරාගණය සිදුවන බෝගයකට උදාහරණයක් වනුයේ,
(1) වී ය. (2) බඩඉරිඟු ය. (3) වට්ටක්කා ය. (4) සූරියකාන්ත ය. (5) ස්ට්‍රෝබෙරි ය.


**2.** බොහෝවිට පැලැස්තර බද්ධය මගින් ප්‍රචාරණය සිදුකරන ශාකයක් වනුයේ,
(1) දූරියන් ය. (2) කොස් ය. (3) තේ ය.
(4) රඹුටන් ය. (5) දිවුල් ය.

**3.** පටක රෝපණ මාධ්‍යයක්, තෙත් ජීවානුහරණය කිරීම සඳහා භාවිත කරනු ලබන උපකරණය වනුයේ,
(1) පීඩන තාපකය ය. (2) කේන්ද්‍රාපසාරකය ය. (3) බේකරි උඳුන ය.
(4) ක්ෂුද්‍ර තරංග උඳුන ය. (5) තල ප්‍රවාහ කැබිනෙට්ටුව ය.

**4.** වගා මාධ්‍යයක් යොදා **නොගන්නා** නිර්පාංශු වගා ක්‍රමයක් වනුයේ,
(1) වාගත වගාව ය. (2) ජලජ වගාව ය.
(3) ගැඹුරු පෝෂක ධාරා තාක්ෂණය ය. (4) පෝෂක පටල තාක්ෂණය ය.
(5) කේශික අවශෝෂණ තාක්ෂණය ය.

● ප්‍රශ්න අංක **05** ට පිළිතුරු සැපයීම සඳහා පහත රූපසටහන භාවිත කරන්න.

**5.** මෙම රූප සටහනේ දැක්වෙන කෘමියා අයත් ගෝත්‍රය වනුයේ,
(1) ඩිප්ටෙරා ය. (2) හෙමිප්ටෙරා ය.
(3) කෝලියොප්ටෙරා ය. (4) හෝමොප්ටෙරා ය.
(5) හයිමෙනොප්ටෙරා ය.



**6.** පලතුරුවල භෞතික පරිණත දර්ශක මැනීමට භාවිත කරනු ලබන උපකරණයක් වනුයේ,
(1) pH මීටරය ය. (2) බ්‍රික්ස් මීටරය ය. (3) දෘඪතාමානය ය.
(4) EC මීටරය ය. (5) තාප යුග්ම උෂ්ණත්වමානය ය.

**7.** විවෘත හිරු එළියේ වියළීම හා සැසඳීමේ දී සූර්යය වියළනයක් තුළ වියළීමේ දී
(1) පිරිවැය අඩු ය. (2) ස්වාදය හානිවීම වැඩි ය.
(3) වර්ණයන් හානිවීම අඩු ය. (4) ප්‍රෝටීන විකරණය වීම වැඩි ය.
(5) උෂ්ණත්ව විචල්‍යතාව වැඩි ය.

Visit EDUHUB

[දෙවැනි පිටුව බලන්න

**8.** නැවුම් ස්ට්‍රෝබෙරි සඳහා වඩාත් යෝග්‍ය අඩු වියදම් ඇසුරුම වනුයේ,

(1) කඩදාසි පෙට්ටි ය.
(2) ඇළුමිනියම් පෙට්ටි ය.
(3) විනිවිද පෙනෙන ප්ලාස්ටික් පෙට්ටි ය.
(4) ස්වාභාවික කෙඳි පෙට්ටි ය.
(5) ලී පෙට්ටි ය.

**9.** දෙනුන්ට කිරි උණ වැළඳීමට හේතුව වනුයේ,

(1) උණුසුම නිසා ඇතිවන විඩාව ය.
(2) බැක්ටීරියා ආසාදනය ය.
(3) රුධිරයේ යකඩ අඩුවීම ය.
(4) රුධිරයේ කැල්සියම් අඩුවීම ය.
(5) රුධිරයේ මැග්නීසියම් අඩුවීම ය.

**10.** ෆ්‍රීෂියන් වර්ගයේ වැස්සියක් 2024 ජනවාරි 1 දින සිංචනය කළ අතර පසුව කරන ලද ගර්භණීභාවය නිශ්චය කිරීමේ පරීක්ෂාව ධනාත්මක විය. වැස්සියගේ පළමු ක්ෂීරණය ඇරඹිය යුත්තේ ආසන්න ලෙස


(1) 2024 ජූලි 6 වන දා ය.
(2) 2024 අගෝස්තු 6 වන දා ය.
(3) 2024 සැප්තැම්බර් 6 වන දා ය.
(4) 2024 ඔක්තෝබර් 6 වන දා ය.
(5) 2024 නොවැම්බර් 6 වන දා ය.

**11.** වන ශාක සමග ගොවිපළ සතුන් ඇතිකිරීම සහ බෝග වගා කිරීම වඩාත් හොඳින් පැහැදිලි කළ හැක්කේ

(1) කාබනික ගොවිතැන ලෙස ය.
(2) බෝග සහ ගොවිපළ සතුන් සමෝධානික ගොවිතැන ලෙස ය.
(3) කෘෂි වන වගාව ලෙස ය.
(4) මිශ්‍ර බෝග වගාව ලෙස ය.
(5) ජෛව ගතික ගොවිතැන ලෙස ය.

● ප්‍රශ්න අංක **12** ට පිළිතුරු සැපයීම සඳහා දී ඇති රූප සටහන යොදා ගන්න.

**12.** මෙම රූප සටහනේ දැක්වෙන ආපදාව වර්ගීකරණය කළ හැක්කේ



(1) භෞතික ලෙස ය.
(2) රසායනික ලෙස ය.
(3) ජීව විද්‍යාත්මක ලෙස ය.
(4) ශ්‍රමක්ෂමතා ලෙස ය.
(5) මනෝ සමාජයීය ලෙස ය.

**13.** ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයට දායක වීම සඳහා මෑතක දී පිහිටුවන ලද දෙපාර්තමේන්තුව වනුයේ

(1) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ය.
(2) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව ය.
(3) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ය.
(4) කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව ය.
(5) සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ය.

**14.** පසක් ආම්ලික වීමට ප්‍රධාන හේතුවක් විය හැක්කේ,

(1) හයිඩ්‍රජන් අයන $(H^+)$ ක්ෂරණය වීම ය.
(2) භාෂ්මික කැටායන ක්ෂරණය වීම ය.
(3) භූගත ජල මට්ටම ඉහළ යාම ය.
(4) දීර්ඝ නියං කාල පැවතීම ය.
(5) ජල සම්පාදනය සඳහා කඨින ජලය භාවිතය ය.

**15.** කාබනික ද්‍රව්‍ය, ජලය සහ වාතයට අමතර ව නිරෝගී පසක තිබිය යුතු අනෙකුත් අත්‍යාවශ්‍ය සංඝටක වනුයේ,


(1) ලවණ සහ පොහොර ය.
(2) ජීවීන් සහ ලවණ ය.
(3) ඛනිජ ද්‍රව්‍ය සහ පොහොර ය.
(4) ජීවීන් සහ ඛනිජ ද්‍රව්‍ය ය.
(5) ජීවීන් සහ පොහොර ය.

Visit EDUHUB

[තුන්වැනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

● ප්‍රශ්න අංක **16** සහ **17** සඳහා පිළිතුරු සැපයීමට පහත දක්වා ඇති දර්ශීය පාංශු පැතිකඩෙහි රූප සටහන යොදා ගන්න.




**16.** සංචායනය වූ ඛනිජ සහ හාෂ්මික කැටායන බහුල ව පවතින පාංශු ස්තරය වනුයේ,
(1) J ය. (2) K ය. (3) L ය. (4) M ය. (5) N ය.

**17.** පරිණත පස් අඩංගු පාංශු ස්තරය/ස්තර වනුයේ,
(1) J ය. (2) J සහ K ය. (3) K සහ L ය. (4) L සහ M ය. (5) M සහ N ය.

**18.** සෘජු පරිවෘත්තිය ශක්තියක් භාවිත **නොකර** ශාක මගින් සිදු කරනු ලබන ඛනිජ අවශෝෂණය හඳුන්වනුයේ
(1) සමූහන අවශෝෂණය ලෙස ය.
(2) සක්‍රීය අවශෝෂණය ලෙස ය.
(3) ශෛලම අවශෝෂණය ලෙස ය.
(4) අක්‍රීය අවශෝෂණය ලෙස ය.
(5) පහසුකම් සැලසූ අවශෝෂණය ලෙස ය.

**19.** යූරියාවල ඇති නයිට්‍රජන් ප්‍රතිශතය වනුයේ
(1) 16% ය. (2) 24% ය. (3) 36% ය. (4) 46% ය. (5) 58% ය.

**20.** තෙතමනයට හා උෂ්ණත්වයට අමතර ව කොම්පෝස්ට් සැකසීමේ ක්‍රියාවලිය සඳහා බලපාන අනෙකුත් ප්‍රධාන සාධක වනුයේ
(1) වාතනය, C/N අනුපාතය සහ ලවණ ප්‍රමාණය ය.
(2) වාතනය, C/N අනුපාතය සහ අමුද්‍රව්‍ය කැබලිවල විශාලත්වය ය.
(3) C/N අනුපාතය, අමුද්‍රව්‍ය කැබලිවල විශාලත්වය සහ ලවණ ප්‍රමාණය ය.
(4) ඛනිජ ප්‍රමාණය, C/N අනුපාතය සහ අමුද්‍රව්‍ය කැබලිවල විශාලත්වය ය.
(5) ක්ෂුද්‍ර ජීවීන්, අමුද්‍රව්‍ය කැබලිවල විශාලත්වය සහ ඛනිජ ප්‍රමාණය ය.


**21.** ඇලි සහ වැටි ජලසම්පාදන ක්‍රමය වඩාත් සුදුසු වනුයේ
(1) අර්තාපල්, උක්, රටකජු, පේර සහ මිදි සඳහා ය.
(2) බඩඉරිඟු, මිදි, වම්බටු, පේර සහ පොල් සඳහා ය.
(3) බඩඉරිඟු, අර්තාපල්, තල, තක්කාලි සහ උක් සඳහා ය.
(4) මිදි, රටකජු, වම්බටු, පොල් සහ තල සඳහා ය.
(5) බඩඉරිඟු, වම්බටු, උක්, රටකජු සහ අර්තාපල් සඳහා ය.

**22.** දුර්වල ජලවහනය හේතුවෙන් තක්කාලි බෝගයට සිදුවිය හැකි සෘජු බලපෑමක් වනුයේ
(1) පත්‍ර රැළි ගැසීම ය. (2) පත්‍ර කහ පැහැවීම ය.
(3) පත්‍ර නටුව දික්වීම ය. (4) මාංශල පත්‍ර ඇතිවීම ය.
(5) රළු පත්‍ර ඇතිවීම ය.

Visit EDUHUB

● ප්‍රශ්න අංක **23** ට පිළිතුරු සැපයීම සඳහා දී ඇති රූප සටහන භාවිත කරන්න.

**23.** මෙම රූප සටහනේ දැක්වෙන සාම්ප්‍රදායික ජලය එසවීමේ උපකරණය වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,



(1) සයිෆනය ලෙස ය.
(2) ආඩියා ලෙස ය.
(3) අත් පොම්පය ලෙස ය.
(4) පැද්දෙන යොත ලෙස ය.
(5) හබල් සක ලෙස ය.

**24.** ප්‍රභාසංශ්ලේෂණයේ අමුද්‍රව්‍ය ලෙස ක්‍රියාකරන ශාක ශ්වසනයේ ඵල වනුයේ


(1) $CO_2$ සහ $O_2$ ය. (2) $CO_2$ සහ $H_2O$ ය. (3) ATP සහ $H_2O$ ය.
(4) $C_6H_{12}O_6$ සහ $O_2$ ය. (5) ATP සහ $C_6H_{12}O_6$ ය.

**25.** බීජ ප්‍රරෝහණ ක්‍රියාවලියේ ප්‍රථම පියවර වනුයේ

(1) බීජාවරණය පැලී යෑම ය.
(2) බීජය තුළ එන්සයිම සක්‍රියවීම ය.
(3) බීජලපය හරහා නිපානය මගින් ජලය ඇතුල්වීම ය.
(4) බීජාවරණය හරහා නිපානය මගින් ජලය ඇතුල්වීම ය.
(5) බීජාවරණය හා බීජලපය හරහා විසරණය මගින් ජලය ඇතුල්වීම ය.

● දී ඇති රූප සටහන මගින් ශිෂ්‍යයෙක් විසින් කරනු ලැබූ පරීක්ෂණයක් දැක්වේ. ප්‍රශ්න අංක **26** ට පිළිතුරු සැපයීම සඳහා මෙම රූප සටහන භාවිත කරන්න.

**26.** මෙම රූප සටහනින් දැක්වෙන සංසිද්ධිය වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,




(1) නිපානය ලෙස ය.
(2) මූල පීඩනය ලෙස ය.
(3) ප්‍රති ආස්‍රැතිය ලෙස ය.
(4) ආස්‍රැති විභවය ලෙස ය.
(5) උත්ස්වේදන චූෂණ බලය ලෙස ය.

**27.** දඬුකැබලිවල මුල් ඇදීම සඳහා බලපාන අභ්‍යන්තර සාධක වනුයේ

(1) උෂ්ණත්වය සහ ආර්ද්‍රතාවය ය.
(2) ශාක විශේෂය සහ මුල් ඇද්දවීමේ මාධ්‍යය ය.
(3) මුල් ඇද්දවීමේ මාධ්‍යය සහ හෝර්මෝන ප්‍රමාණය ය.
(4) මේරූ ප්‍රමාණය හා හෝර්මෝන ප්‍රමාණය ය.
(5) මේරූ ප්‍රමාණය හා මුල් ඇද්දවීමේ මාධ්‍යය ය.

**28.** ශ්‍රී ලංකාවේ පහත රට කලාපය සඳහා ආරක්ෂිත ගෘහයක් සැලසුම් කිරීමේ දී සලකා බැලිය යුතු ප්‍රධාන පාරිසරික සීමාකාරී සාධකය වනුයේ

(1) සුළඟ ය. (2) වර්ෂාපතනය ය. (3) ආර්ද්‍රතාවය ය.
(4) උෂ්ණත්වය ය. (5) ආලෝක තීව්‍රතාවය ය.

Visit EDUHUB

[පස්වැනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



**29.** ශිෂ්‍යයෙක් පරපරාගණය වන ශාකයකින් ලබාගත් බීජ, පාලිත තත්ත්වයන් යටතේ හරිතාගාරයක වගාකරන ලදී. එම පැළ පරිණත වූ පසු ඒවා අතර පැහැදිලි රූප විද්‍යාත්මක විචලතා නිරීක්ෂණය කරන ලදී. මෙම විචලතා සඳහා වඩාත් හේතුවිය හැක්කේ,

(1) කාලගුණික විපර්යාස ය. (2) ප්‍රවේණි සාධක ය. (3) ජාන විකෘතිතා ය.
(4) හරිතාගාර ආවරණය ය. (5) පාරිසරික සාධක ය.

**30.** නුදුරු අනාගතයේ දී සහල් මිල වැඩි වේ යැයි පාරිභෝගිකයන් උපකල්පනය කළහොත්

(1) වෙළෙඳපොළ සහල් සැපයුම වැඩි වනු ඇත.
(2) වෙළෙඳපොළ සහල් සැපයුම අඩු වනු ඇත.
(3) සහල් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම වැඩි වනු ඇත.
(4) සහල් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම අඩු වනු ඇත.
(5) වෙළෙඳපොළ සහල් සැපයුමට හෝ ඉල්ලුමට බලපෑමක් ඇති නොවනු ඇත.

**31.** තිරසාර කෘෂිකර්මාන්තය හා සම්බන්ධ වගන්ති දෙකක් පහත දැක් වේ.

A - තිරසාර කෘෂිකර්මාන්තය, භූමියේ ඵලදායිතාව දීර්ඝ කාලයක් පවත්වා ගනු ලබයි.
B - තිරසාර කෘෂිකාර්මික පිළිවෙත්, ගොවිතැන මගින් පරිසරයට ඇතිවන ඍණාත්මක බලපෑම් අවම කරයි.

ඉහත වගන්තිවලින්

(1) A සහ B යන දෙක ම වැරදි ය.
(2) A නිවැරදි වන නමුත්, B වැරදි ය.
(3) B නිවැරදි වන නමුත්, A වැරදි ය.
(4) A නිවැරදි වන අතර, B මගින් එය තවදුරටත් පැහැදිලි කෙරේ.
(5) B නිවැරදි වන අතර, A මගින් එය තවදුරටත් පැහැදිලි කෙරේ.

**32.** කෘෂි උපදේශකවරයෙක් විසින් පිපිඤ්ඤා වගාවක පහත ගැටලු සොයාගන්නා ලදී.

A - ශාක උත්ස්වේදනය ඉතා අඩු බව
B - පිටි පුස් ආසාදනය ඉතා අධික බව

ඉහත තත්ත්වයන් ඇතිවීමට ප්‍රධාන හේතුව විය හැක්කේ,

(1) මඳ සුළඟ ය. (2) අඩු හිරුඑළිය ය. (3) වැඩි ආර්ද්‍රතාව ය.
(4) ඇඩි නියං තත්ත්වය ය. (5) ඉහළ උෂ්ණත්වය ය.

● එක්තරා කාල සීමාවක දී වට්ටක්කා වෙළෙඳපොළ තත්ත්වය පහත වගුවෙන් විස්තර කෙරේ. මෙම වගුව ආශ්‍රයෙන් ප්‍රශ්න අංක 33 ට පිළිතුරු සපයන්න.

| මිල (කිලෝග්‍රෑමයට රුපියල්) | ඉල්ලුම් කරන ප්‍රමාණය (කිලෝග්‍රෑම්) | සැපයුම් කරන ප්‍රමාණය (කිලෝග්‍රෑම්) |
|---|---|---|
| 90 | 10 | 100 |
| 70 | 20 | 80 |
| 50 | 30 | 60 |
| 40 | 40 | 40 |
| 30 | 50 | 20 |

**33.** වට්ටක්කා කිලෝග්‍රෑම් 1 ක මිල රු. 70 වුවහොත්,

(1) කිලෝග්‍රෑම් 30 ක අතිරික්තයක් ඇති විය හැකි අතර මිල පහළ යා හැකි ය.
(2) කිලෝග්‍රෑම් 60 ක අතිරික්තයක් ඇති විය හැකි අතර මිල ඉහළ යා හැකි ය.
(3) කිලෝග්‍රෑම් 60 ක අතිරික්තයක් ඇති විය හැකි අතර මිල පහළ යා හැකි ය.
(4) කිලෝග්‍රෑම් 30 ක හිඟයක් ඇති විය හැකි අතර, මිල ඉහළ යා හැකි ය.
(5) හිඟතාවක් හෝ අතිරික්තයක් ඇති **නොවන** අතර, මිල **නොවෙනස්ව** පවතී.

Visit EDUHUB

**34.** ගොවිපළ සතෙකුගේ නිෂ්පාදන හැකියාව සුවිශේෂී ලෙස පහළ දමන කාලගුණික සාධක සංකලනය වනුයේ

(1) දිගු දිවා කාලය සහ ඉහළ ආලෝක තීව්‍රතාව ය.

(2) අඩු පරිසර උෂ්ණත්වය සහ ඉහළ වර්ෂාපතනය ය.

(3) අඩු පරිසර උෂ්ණත්වය සහ අඩු සාපේක්ෂ ආර්ද්‍රතාව ය.

(4) ඉහළ පරිසර උෂ්ණත්වය සහ අඩු සාපේක්ෂ ආර්ද්‍රතාව ය.

(5) ඉහළ පරිසර උෂ්ණත්වය සහ ඉහළ සාපේක්ෂ ආර්ද්‍රතාව ය.

**35.** සත්ත්ව ආහාර පිළිබඳ වගන්ති කිහිපයක් පහත දැක් වේ.

A - දළ ආහාරවල 18% කට වඩා තන්තු අන්තර්ගත වේ.

B - කුකුල් ආහාරවල වඩාත් බහුල පෝෂකය, ප්‍රෝටීන් වේ.

C - රෝමාන්තික නොවන සතුන්ට සාමාන්‍යයෙන් වැඩිපුර සාන්ද්‍ර ආහාර ලබාදෙන නමුත් රෝමාන්තික සතුන්ට වැඩිපුර දළ ආහාර අවශ්‍ය වේ.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.

(4) A සහ B පමණි. (5) A සහ C පමණි.

**36.** තිරිඟු පිටි නිෂ්පාදන කර්මාන්තයේ අනෙකුත් සියලු ම යෙදවුම් **නොවෙනස්ව** තිබිය දී තිරිඟු මිල ඉහළ ගියහොත්

(1) තිරිඟු පිටි සැපයුම වැඩි වේ.

(2) තිරිඟු පිටි සැපයුම අඩු වේ.

(3) තිරිඟු පිටි වලට ඇති ඉල්ලුම වැඩි වේ.

(4) තිරිඟු පිටි සැපයුමට බලපෑමක් ඇති නොවේ.

(5) තිරිඟු පිටි ඉල්ලුම සහ සැපයුම යන දෙකම වැඩි වේ.

**37.** 'යල' කන්නය පිළිබඳ නිවැරදි වගන්තිය වනුයේ

(1) "නිරිතදිග මෝසම් වැසි පටන්ගැන්මත් සමග එය ආරම්භ වේ" යන්න ය.

(2) "පළමුවන අන්තර් මෝසම් වැසිවල බලපෑම යල කන්නය පුරාවට පවතී" යන්න ය.

(3) "යල කන්නයේ වර්ෂාපතන කාලසීමාව තෙත්, වියළි සහ අතරමැදි යන සියලු කලාපවල සමාන ය" යන්න ය.

(4) "එය මාර්තු සිට අගෝස්තු දක්වා පවතින අතර, පළමු අන්තර් මෝසම සහ නිරිතදිග මෝසම යන දෙකෙන් ම වැසි ලැබේ" යන්න ය.

(5) "යල කන්නයේ දී, තෙත් කලාපයට මාර්තු සිට අප්‍රේල් දක්වා ද වියළි කලාපයට මාර්තු සිට ජූනි දක්වා ද ඉහළ ම වර්ෂාපතනයන් ලැබේ" යන්න ය.

**38.** කුකුළු පාලනය පිළිබඳ වගන්ති කිහිපයක් පහත දැක්වේ.

A - පැටවු රක්කවනයක (brooder) චික් ගාර්ඩ් එකක් භාවිත කරනුයේ කුකුළු පැටවුන් විලෝපිකයන්ගෙන් ආරක්ෂා කර ගැනීමට ය.

B - ශ්‍රී ලංකාවේ ගම් කුකුළන් සාමාන්‍යයෙන් ඇති කරනුයේ නිදැළි ක්‍රමයට ය.

C - බිත්තර රැක්කවීමේ සාමාන්‍ය කාලය කුකුළු වර්ගය මත රඳා පවතී.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.

(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

Visit EDUHUB



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**39.** දේශීය ගවයන්ගේ කිරි නිෂ්පාදන විභවය ඊළඟ පරම්පරාවේ දී වැඩි කර ගැනීම සඳහා හොඳම ක්‍රමය වනුයේ

(1) සමූහ වරණය ය.

(2) ගව රැළ තුළ අහඹු පට්ටි දැමීම ය.

(3) තෝරාගත් දේශීය දෙනුන් ජර්සි පුං ගවයෙකු සමග පට්ටි දැමීම ය.

(4) තෝරාගත් දේශීය දෙනුන් ෆ්‍රීෂියන් පුං ගවයෙකු සමග පට්ටි දැමීම ය.

(5) තෝරාගත් දේශීය දෙනුන් තෝරාගත් දේශීය පුං ගවයෙකු සමග පට්ටි දැමීම ය.

**40.** ගොවිපළ සතුන්ගේ ආහාර මාර්ග පද්ධතිය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ

(1) "පරිණත රෝමාන්තිකයෙකුගේ අන්නස්‍රෝතය විතංශිකාවට විවර වේ" යන්න ය.

(2) "ඕනෑම ගොවිපළ සතෙකුගේ ආහාර මාර්ග පද්ධතියේ ඇත්තේ එක් උණ්ඩුක පුච්ඡයක් පමණි" යන්න ය.

(3) "ක්‍රියාකාරිත්වය අතින් එළදෙනකගේ සංකීර්ණ ආමාශය කිකිළියකගේ චාර්වකයට සමාන ය" යන්න ය.

(4) "රූමනය, එළදෙනකගේ ආහාර මාර්ග පද්ධතියේ සමස්ත ධාරිතාවට සාපේක්ෂව, විශාල ම කුටීරය වේ" යන්න ය.

(5) "රෝමාන්තිකයෙකුගේ සංකීර්ණ ආමාශයේ සහ රෝමාන්තික නොවන සතෙකුගේ සරල ආමාශයේ ජීර්ණ ක්‍රියාවලිය සෑම අතින් ම සමාන වේ" යන්න ය.

**41.** ස්වයං රැකියා නියුක්තිකයෙක් රු. 4,000 ක ස්ථාවර පිරිවැයක් දරමින් කඩදාසි බෑග් නිෂ්පාදනය කරයි. එක් කඩදාසි බෑගයක සාමාන්‍ය විචල්‍ය පිරිවැය හා සාමාන්‍ය මුළු පිරිවැය පිළිවෙළින් රු. 25 සහ රු. 30 නම්, නිෂ්පාදනය කළ කඩදාසි බෑග් ප්‍රමාණය වනුයේ

(1) 200 කි. (2) 400 කි. (3) 600 කි. (4) 800 කි. (5) 1 000 කි.

**42.** විෂමජාති ප්‍රභේදනයක් සහිත භාණ්ඩයක් හා සම්බන්ධ වෙළෙඳුන් රාශියක් සිටින වෙළෙඳපළ ව්‍යුහය වනුයේ

(1) සිල්ලර වෙළෙඳපොළ ය. (2) කතිපයාධිකාරී වෙළෙඳපොළ ය.

(3) තොග වෙළෙඳපොළ ය. (4) පූර්ණ තරගකාරී වෙළෙඳපොළ ය.

(5) ඒකාධිකාරී තරගයක් සහිත වෙළෙඳපොළ ය.

**43.** රජය මගින් බදු පදනම මත නිකුත් කළ වාර්ෂික කෘෂිකාර්මික ඉඩම් බලපත්‍රයක් ඇති ගොවිමහතෙකු, එම භූමියෙහි වගා කිරීම සඳහා කෘෂිකාර්මික ණයක් ලබාගැනීමට රාජ්‍ය බැංකුවකට යන ලදී. බැංකුව ඔහුට ණය ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදී. මෙයට සම්බන්ධ නීතිමය කරුණ අදාළ වනුයේ

(1) සහනාධාරවලට ය. (2) අලෙවිකරණයට ය. (3) වගා රක්ෂණයට ය.

(4) ඉඩම් හිමිකාරිත්වයට ය. (5) වාරි ජලය සැපයීමට ය.

**44.** බිම් සැකසීම හා සම්බන්ධ වගන්ති දෙකක් පහත දැක්වේ.

A - බිම් සැකසීම, වල්නාශක භාවිතය අඩු කරයි.

B - බිම් සැකසීමේ අරමුණ වනුයේ පස, බෝග සංස්ථාපනයට සහ වර්ධනයට වඩාත් සුදුසු භෞතික තත්ත්වයට පත්කිරීම ය.

ඉහත වගන්තිවලින්

(1) A සහ B යන දෙක ම නිවැරදි ය.

(2) A නිවැරදි වන නමුත්, B වැරදි ය.

(3) B නිවැරදි වන නමුත්, A වැරදි ය.

(4) A නිවැරදි වන අතර, B මගින් එය තවදුරටත් පැහැදිලි කෙරේ.

(5) B නිවැරදි වන අතර, A මගින් එය තවදුරටත් පැහැදිලි කෙරේ.

Visit EDUHUB

**45.** අතුරු යත් ගැම හා සම්බන්ධ වගන්ති දෙකක් පහත දැක්වේ.

A - එය බෝග සංස්ථාපනයට මොහොතකට පෙර සිදු කරයි.

B - එය වගාකරන ලද ශාකවල වර්ධනයට, අස්වැන්නට හා සමස්ත නිරෝගීභාවයට උපකාරී වේ.

ඉහත වගන්තිවලින්

(1) A සහ B යන දෙක ම නිවැරදි ය.

(2) A නිවැරදි වන නමුත්, B වැරදි ය.

(3) B නිවැරදි වන නමුත්, A වැරදි ය.

(4) A නිවැරදි වන අතර, B මගින් එය තවදුරටත් පැහැදිලි කෙරේ.

(5) B නිවැරදි වන අතර, A මගින් එය තවදුරටත් පැහැදිලි කෙරේ.

**46.** බහුවාර්ෂික වල් පැළෑටියකට උදාහරණයක් වනුයේ

(1) ගඳපාන (*Lantana camara*) ය.

(2) කුප්පමේනිය (*Acalipa indica*) ය.

(3) කඩු පහර (*Emila sonchifolia*) ය.

(4) මොණරකුඩුම්බිය (*Vernonia cinera*) ය.

(5) තුණැස්ස (*Cyperus iria*) ය.

**47.** සංස්ථානික පූර්ව-නිර්ගමන වල්නාශකයකට උදාහරණයක් වනුයේ

(1) 2,4-D ය. (2) MCPA ය. (3) පැරකොට් ය.

(4) ඇට්රසීන් ය. (5) ග්ලයිෆොසෙට් ය.

**48.** වාතය මගින් බෝවෙන ශාක රෝගයකට උදාහරණයක් වනුයේ

(1) මිරිස් කොළ කොඩ වීම ය. (2) තේ ශාකයේ බිබිලි අංගමාරය ය.

(3) අර්තාපල් බෝගයේ පසු අංගමාරය ය. (4) කෙසෙල් පත්‍ර විචිත්‍ර රෝගය ය.

(5) රබර් ශාකයේ සුදු මුල් රෝගය ය.

**49.** පළිබෝධයන්ගේ විවිධ වර්ධන අවධි විනාශ කරන එක්තරා පියාඹන කෘමි විලෝපිකයෙකුට, සිය ජීවන චක්‍රය සම්පූර්ණ කිරීමට ජලය අවශ්‍ය වේ. මෙම විලෝපිකයා හොඳින්ම හඳුනාගත හැක්කේ

(1) දෙබරා ලෙස ය. (2) පතැඟියා ලෙස ය.

(3) පලතුරු මැස්සා ලෙස ය. (4) බත් කූරා ලෙස ය.

(5) කළු සොල්දාදු මැස්සා ලෙස ය.

**50.** මානව සෞඛ්‍යය හා පෝෂණය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - තරබාරු බව මගින් කිරීටක හෘද රෝග අවදානම වැඩි කරයි.

B - තන්තු ප්‍රමාණය වැඩි ආහාර මගින් පෝෂක අවශෝෂණය වැඩි විය හැකි ය.

C - ආහාර වේලෙහි යකඩ අඩු මට්ටමක පැවතීම, ප්‍රෝටීන හා ශක්ති මන්දපෝෂණයට ඍජුවම දායක වේ.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.

(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

* * *

Visit EDUHUB

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

AL/2024/08/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

කෘෂි විද්‍යාව II
விவசாய விஞ்ஞானம் II
Agricultural Science II

**08 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය :** ..................................

**උපදෙස් :**

* මෙම ප්‍රශ්න පත්‍රය පිටු **11** කින් සහ ප්‍රශ්න **10** කින් සමන්විත වේ.
* මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත වන අතර කොටස් **දෙකට ම** නියමිත කාලය **පැය තුනකි.**

**A කොටස — ව්‍යුහගත රචනා (පිටු අංක 2 - 10)**

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු **නොවන** බව ද සලකන්න.

**B කොටස — රචනා (පිටු අංක 11)**

* ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A** සහ **B** කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ **A** කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
* ප්‍රශ්න පත්‍රයේ **B** කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| (08) කෘෂි විද්‍යාව - II | | |
|---|---|---|
| **කොටස** | **ප්‍රශ්න අංක** | **ලැබූ ලකුණු** |
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| | 8 | |
| | 9 | |
| | 10 | |
| **එකතුව** | | |

| **එකතුව** | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| **සංකේත අංක** | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය කළේ | |

Visit EDUHUB

03030000520114469

මෙම තීරයේ කිසිවක් නොලියන්න

## A කොටස - ව්‍යුහගත රචනා

**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.

(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 100 කි.)

1. (A) බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රම කෘෂිකාර්මික සංවර්ධනය සඳහා විවිධ ආකාරයෙන් පහසුකම් සපයනු ලබයි. ශ්‍රී ලංකාවේ මෑතක දී ක්‍රියාවට නංවන ලද බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(i) ..........

(ii) ..........

(B) දේශගුණික සාධක ශාක වර්ධනයට ඇති කරනු ලබන බලපෑම මගින් කෘෂිකාර්මික ඵලදායිතාවට බලපෑම් ඇති කරයි.

(i) සුළඟ මගින් බෝග නිෂ්පාදනය කෙරෙහි ඇති කරනු ලබන හිතකර බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(ii) යාපනයේ අර්තාපල් වගා කරනු ලබන ප්‍රධාන කන්නය වනුයේ ඔක්තෝම්බර් සිට පෙබරවාරි දක්වා ය. යාපනයේ අර්තාපල් වගා කන්නය තීරණය කරනු ලබන ප්‍රධාන දේශගුණික සාධකය කුමක් ද?

..........

(iii) බෝග නිෂ්පාදනය කෙරෙහි අධික සාපේක්ෂ ආර්ද්‍රතාව මගින් ඇති කරනු ලබන අහිතකර බලපෑමක් සඳහන් කරන්න.

..........

(C) පාංශු ජනනය සඳහා පාෂාණ ජීර්ණය අත්‍යාවශ්‍ය වේ.

(i) පාෂාණ ජීර්ණයට බලපානු ලබන ජෛවීය සාධක **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(ii) පාෂාණ ජීර්ණයට බලපානු ලබන භෞතික සාධක **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(D) පාංශු තෙතමනය, ශාක සහ පාංශු ජීවීන් යන දෙකොට්ඨාශයේ ම පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වේ.

(i) පසෙහි තෙතමන තත්ත්ව **තුන** නම් කරන්න.

(1) ..........

(2) ..........

(3) ..........

(ii) විද්‍යාගාරය තුළ දී පාංශු තෙතමන ප්‍රමාණය මැනීමට යොදාගත හැකි ක්‍රමයක් නම් කරන්න.

..........

Visit EDUHUB

[තුන්වැනි පිටුව බලන්න



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(E) පොහොර ප්‍රධාන කාණ්ඩ තුනකට වර්ගීකරණය කරනු ලැබේ. පොහොර කාණ්ඩ **තුන** සඳහන් කර එම එක් එක් කාණ්ඩය සඳහා උදාහරණය බැගින් දක්වන්න.

| | පොහොර කාණ්ඩය | උදාහරණය |
|---|---|---|
| (i) | .............................................. | .............................................. |
| (ii) | .............................................. | .............................................. |
| (iii) | .............................................. | .............................................. |

(F) බෝග සංස්ථාපනය සඳහා බීජ වප්කර යොදා ගැනේ.

(i) මඩ වී ගොවිතැන සඳහා සුලබව භාවිත කරන බීජ වප්කර **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................


(2) ..............................................................................................

(ii) බෝග සංස්ථාපනයේ දී බීජ වප්කර යොදාගැනීමේ ප්‍රධාන වාසි **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(G) ප්‍රශ්න කොටස් (i) සහ (ii) සඳහා පිළිතුරු සැපයීමට පහත රූප සටහන භාවිත කරන්න.




(i) ඉහත රූප සටහනෙහි දක්වා ඇති ජල පොම්ප ආකාරය නම් කරන්න.

..............................................................................................

(ii) ඉහත රූප සටහනෙහි P, Q, R සහ S ලෙස දක්වා ඇති කොටස් නම් කරන්න.

(1) P ..............................................

(2) Q ..............................................

(3) R ..............................................

(4) S ..............................................

(H) බෝග නිෂ්පාදනය වැඩි කර ගැනීමෙහිලා පරාගකාරකයින් ඉමහත් කාර්යයක් ඉටු කරනු ලබයි. බෝග ක්ෂේත්‍රවල පරාගකාරකයින් ආරක්ෂා කර ගැනීම සඳහා උපකාරී වන ක්‍රමෝපායන් **දෙකක්** සඳහන් කරන්න.

(i) ..............................................................................................

(ii) ..............................................................................................

100

Visit EDUHUB

මෙම තීරයේ කිසිවක් නොලියන්න


**2.** (A) බෝගයේ පාරිභෝගික ජල අවශ්‍යතා සඳහා භාවිත වූ ජල ප්‍රමාණය සහ බෝගයට සපයන ලද මුළු ජල ප්‍රමාණය අතර අනුපාතය ජල සම්පාදන කාර්යක්ෂමතාව ලෙස හඳුන්වයි. ජල සම්පාදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට යොදාගත හැකි ක්‍රමෝපායන් **තුනක්** සඳහන් කරන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

(iii) ..........................................................................................

(B) ප්‍රශ්න (i) සහ (ii) සඳහා පිළිතුරු සැපයීමට පහත රූප සටහන යොදා ගන්න.




(i) ඉහත රූප සටහනෙහි දක්වා ඇති කායික විද්‍යාත්මක ක්‍රියාවලිය සඳහන් කරන්න.

..........................................................................................

(ii) ඉහත රූප සටහනෙහි දක්වා ඇති කායික විද්‍යාත්මක ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා යොදාගත හැකි ක්‍රමෝපාය **තුනක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(C) ප්‍රශස්ත වගා තත්ත්ව යටතේ වුව ද ජීව්‍ය බීජයකට ප්‍රරෝහණය වීමට නොහැකි වීම බීජ සුප්තතාව ලෙස හඳුන්වයි. පහත බෝගවල බීජ සුප්තතාව ඉවත් කිරීම සඳහා වඩාත් ම සුදුසු ක්‍රමය සඳහන් කරන්න.

(i) අඹ

..........................................................................................

(ii) සියඹලා

..........................................................................................

(iii) තේක්ක

..........................................................................................

(iv) පැපොල්

..........................................................................................

Visit EDUHUB

[පස්වැනි පිටුව බලන්න



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(D) ශාක ප්‍රචාරණය යනු ශාක ගුණනය කිරීමේ ක්‍රියාවලියයි. පහත බෝග ප්‍රචාරණය සඳහා වඩාත් සුදුසු ප්‍රචාරක ව්‍යුහය බැගින් සඳහන් කරන්න.

(i) ටියුලිප්

..........................................................................................................

(ii) කහ

..........................................................................................................

(iii) ගෝනිගස්

..........................................................................................................

(iv) අන්නාසි

..........................................................................................................

(E) අතු බැඳීම යනු ශාකයක කඳ හෝ අත්තක් මව් ශාකයට සම්බන්ධව තිබිය දී ම තෙත් වගා මාධ්‍යයකින් ආවරණය කර මුල් ඇද්දවීම මගින් සිදු කරනු ලබන වර්ධක ප්‍රචාරණ ක්‍රමයකි. පහත දක්වා ඇති භූමි අතු බැඳීමේ ක්‍රම විදහා දැක්වීම සඳහා උචිත රේඛා සටහන් අඳින්න.

(i) සරල අතු බැඳීම

(ii) සංයුක්ත අතු බැඳීම

(iii) අගල් අතු බැඳීම

(iv) ගොඩැලි අතු බැඳීම

Visit EDUHUB

024469

010300005201144469

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(F) ශාක පටක රෝපණය යනු ප්‍රවේණික ව සර්වසම පැළ විශාල සංඛ්‍යාවක් ලබා ගැනීම සඳහා සුලබ ව භාවිත වන ක්‍රමෝපායකි. ශාක පටක රෝපණ මාධ්‍යයක ඇති පහත ද්‍රව්‍යයන්ගේ කාර්යභාරය සඳහන් කරන්න.

(i) අකාබනික පෝෂක ..............................

(ii) සීනි ..............................

(iii) වර්ධක යාමක ..............................

(iv) ජෙල්කාරක ..............................

(G) බෝග වැඩි දියුණු කිරීමේ දී ශාක ජාන සම්පත් වැදගත් වේ.

(i) ශාක ජාන සම්පත් සංරක්ෂණය කරනු ලබන ප්‍රධාන ක්‍රම **දෙක** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(ii) ශාක ජාන සම්පත් සංරක්ෂණයේ ප්‍රධාන වැදගත්කම් **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(H) වියළි කලාපයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි සර්පයන් දෂ්ට කිරීම් සුලබ ය. කෘෂිකාර්මික ක්ෂේත්‍රයන් තුළ වැඩ කිරීමේ දී සර්පයන් දෂ්ට කිරීම වළක්වා ගැනීම සඳහා ගොවීන් අනුගමනය කළ යුතු ක්‍රමෝපායන් **දෙකක්** සඳහන් කරන්න.

(i) ..............................

(ii) ..............................

100

**3.** (A) ආරක්ෂිත කෘෂිකර්මය යනු පාලිත පරිසර තත්ත්වයන් යටතේ බෝග වගා කිරීමේ ක්‍රියාවලිය ය. ආරක්ෂිත කෘෂිකර්මයේ දී පාලනය කරනු ලබන පාරිසරික සාධක **දෙකක්** සඳහන් කරන්න.

(i) ..............................

(ii) ..............................

(B) වගා මාධ්‍ය ලෙස පස් හැර වෙනත් ඕනෑම මාධ්‍යයක ශාක වගා කිරීම නිර්පාංශු වගාව ලෙස අර්ථ දක්වයි. නිර්පාංශු ඝන වගා මාධ්‍යයක තිබිය යුතු වැදගත් ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(i) ..............................

(ii) ..............................

(C) යාන්ත්‍රික හෝ භෞතික පළිබෝධ පාලන ක්‍රම, සාර්ථක ඒකාබද්ධ පළිබෝධ පාලන සැලසුමක අවශ්‍යයෙන්ම තිබිය යුතු අංගයකි. පහත සඳහන් පළිබෝධ හානි පාලනය කරගැනීමට වඩාත් ම සුදුසු යාන්ත්‍රික හෝ භෞතික ක්‍රමය සඳහන් කරන්න.

(i) පලතුරු මැස්සාගෙන් පේරවලට වන හානිය

..............................

Visit EDUHUB

[හත්වැනි පිටුව බලන්න



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(ii) වවුලන්ගෙන් රඹුටන්වලට වන හානිය

........................................................................................................................

(iii) පුරුක් පණුවාගෙන් ගොයමට වන හානිය

........................................................................................................................

(D) කෘමි පළිබෝධකයන් විනාශ කිරීමට හෝ පළවා හැරීමට භාවිත කරන ද්‍රව්‍ය කෘමිනාශක ලෙස හැඳින්වේ. කෘමිනාශක, ඒවායේ භෞතික ස්වභාවය, රසායනික ස්වභාවය හා ක්‍රියාකරන ආකාරය අනුව වර්ග කරන්න.

(i) භෞතික ස්වභාවය අනුව

(1) ..............................................

(2) ..............................................

(3) ..............................................

(4) ..............................................

(ii) රසායනික ස්වභාවය අනුව

(1) ..............................................

(2) ..............................................

(3) ..............................................

(4) ..............................................

(iii) ක්‍රියා කරන ආකාරය අනුව

(1) ..............................................

(2) ..............................................

(3) ..............................................

(4) ..............................................

(E) ගොවියෙක් තම වගා බිමට කෘමිනාශක ඉසීම සඳහා යන ලදී. තම පියා කෘමිනාශක ඉසීම සඳහා වගාබිමට පිටත් වූ බව දැනගත් ඔහුගේ පුතා, තම පියාගේ ඇඳුම් හා තුවායක් පොලිතින් කවරයකින් හොඳින් ඔතාගෙන, සබන් හා ජලය ද රැගෙන වහාම වගා බිමට ගොස්, පියා කෘමිනාශක ඉසීම අවසන් වන තුරු එදෙස බලා සිටියේය.

(i) ගොවියාගේ පුතා ඉක්මනින් ම ක්ෂේත්‍රයට ගොස් කෘමිනාශක ඉසීම අවසන් වන තුරු එහි රැඳී සිටියේ කුමක් නිසා ද?

........................................................................................................................

(ii) ඔහු ක්ෂේත්‍රයට සබන් සහ ජලය රැගෙන ගියේ කුමක් සඳහා ද?

Visit EDUHUB ........................................................................................................................

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(iii) ඔහු ගොවියාගේ ඇඳුම් හා තුවායක් ක්ෂේත්‍රයට රැගෙන ගියේ කුමක් නිසා ද?

..............................................................................................................

(iv) ඔහු ඇඳුම් සහ තුවාය පොලිතීන් බෑගයක දමා හොඳින් ඔතා ගත්තේ කුමක් නිසා ද?

..............................................................................................................

(F) යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) යනු ආරක්ෂාකාරී සහ තිරසාර බෝග සහ සත්ත්ව නිෂ්පාදනය පිණිස ඇති සම්මතයන් කාණ්ඩයකි. එහි ප්‍රධාන අරමුණක් වනුයේ ආහාරවල ගුණාත්මය සහ ආරක්ෂාකාරීභාවය තහවුරු කර ගැනීම ය. GAP සහතික කිරීමේ ක්‍රියාවලියේ දී සිදු කළ යුතු ප්‍රධාන ක්‍රියාකාරකම් **හතරක්** ලැයිස්තුගත කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

(iii) ..............................................................................................................

(iv) ..............................................................................................................

(G) මිශ්‍රබෝග වගාව යනු එකම ක්ෂේත්‍රයේ එකවර බෝග දෙකක් හෝ කිහිපයක් වගාකිරීමයි.

(i) මිශ්‍ර බෝග වගාවේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(ii) මිශ්‍ර බෝග වගාවේ අවාසි **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

100

**4.** (A) පලතුරු සහ එළවලුවල පසු අස්වනු හානිය අවම කරගැනීම පිණිස, අස්වනු නෙළන අවස්ථාවේ දී සලකා බැලිය යුතු පෙර අස්වනු සාධක **හතරක්** සඳහන් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

(iii) ..............................................................................................................

(iv) ..............................................................................................................

(B) 2024 වර්ෂයේ පළමු කාර්තුවේ දී ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල අධික පරිසර උෂ්ණත්වයක් පැවතුණි. ගොවිපළක සිටින බිත්තර දමන කිකිළියන් මෙම තත්ත්වයට දක්වන ලද හැසිරීමේ ප්‍රතිචාර **දෙකක්** සඳහන් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

Visit EDUHUB



0000788

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(C) ගොවියෙකු තෘණ සයිලේජ් සැකසීම සඳහා වර්ෂා දිනයක, නැවුම් තණකොළ කැපුවේ ය. ඔහු එම තණකොළ වහලක් යට දිනක් අතුරා තැබුවේ ය. ඉන්පසු ඒවා වල සයිලෝවක් තුළ හොඳින් තද කරමින් ඇසුරුවේ ය. සයිලෝව තණකොළවලින් පිරුණු විගස, එය ඝන පොලිතීනයකින් ආවරණය කර මුද්‍රා තැබුවේ ය.

පහත එක් එක් ක්‍රියාකාරකම සඳහා ප්‍රධාන හේතුව බැගින් සඳහන් කරන්න.

(i) තණකොළ එක් දිනක් බිම අතුරා තැබීම

..........................................................................................................................

(ii) වහලක් යට තණකොළ ඇතිරීම

..........................................................................................................................

(iii) සයිලෝව තුළ තණකොළ තද කිරීම

..........................................................................................................................

(iv) පිරවීමෙන් පසු සයිලෝව මුද්‍රා තැබීම

..........................................................................................................................


(D) රූමනය හා වටනය අතර ප්‍රධාන වෙනස්කම් **තුනක්** සඳහන් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

(iii) ..........................................................................................................................

(E) කිකිළි බිත්තරයක ව්‍යුහය පහත රූප සටහනෙන් දක්වා ඇත. ප්‍රශ්න අංක (i) සහ (ii) ට පිළිතුරු සැපයීමට මෙය යොදා ගන්න.




(i) A සහ B ලෙස ලේබල් කර ඇති කොටස් නම් කරන්න.

(1) A ..............................................

(2) B ..............................................

(ii) A සහ B කොටස්වල අඩංගු ප්‍රධාන පෝෂකය සඳහන් කරන්න.

(1) A ..............................................

(2) B ..............................................

Visit EDUHUB

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(F) පහත ප්‍රකාශ '**සත්‍ය**' හෝ '**අසත්‍ය**' දැයි දක්වන්න.


**සත්‍ය/ අසත්‍ය**

(i) උපතේ සිට ප්‍රථම දින 7 තුළ දී වසු පැටවුන්ට මුල් කිරි ලබා දිය යුතු ය. ................

(ii) පිරිසිදු බිත්තර ලබා ගැනීම සඳහා බිත්තර දමන කිකිළියන් සිටින ඝන ආස්තරණ කුකුල් නිවසක කිකිළියන් 4-5 සඳහා අවම වශයෙන් එක් බිත්තර දමන කැදැල්ලක් බැගින් තිබිය යුතු ය. ................

(iii) ෆ්‍රීෂියන් දෙනකගේ කිරිවල සාමාන්‍ය මේද ප්‍රමාණය 3.5% ක් වන අතර, එය ආසියානු එළදෙනුන්ගේ කිරිවල ඊට වඩා වැඩි විය හැකි ය. ................

(G) කෘෂිකාර්මික භාණ්ඩ ගොවිපළේ සිට පාරිභෝගිකයා දක්වා ප්‍රවර්ධනය, අලෙවිකරණය හා බෙදාහැරීමේ ක්‍රියාවලිය කෘෂි අලෙවිකරණය ලෙස හඳුන්වයි. කෘෂි අලෙවිකරණ ක්‍රියාකාරකම් දාමයේ විවිධ සංඝටක පහත රූප සටහනේ දැක්වේ.




(i) ඉහත සටහනෙහි දක්වා ඇති A, B, C සහ D යන සංඝටක නම් කරන්න.

(1) A ..............................................

(2) B ..............................................

(3) C ..............................................

(4) D ..............................................

(ii) නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා භාණ්ඩ අලෙවිකරණය සිදු කිරීමේ දී පහසුකම් සලසා දෙන්නා අතරමැදියා වේ. අලෙවිකරණයේ දී දක්නට ලැබෙන අතරමැදීන් වර්ග **තුනක්** නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(3) ..................................................................................................

(iii) කෘෂි නිෂ්පාදන බෙදා හැරීමේ හා අලෙවිකිරීම පහසු කිරීම සඳහා විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවා ඇත. ශ්‍රී ලංකාවේ දක්නට ඇති එවැනි විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන **තුනක්** නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(3) ..................................................................................................

100

* *

Visit EDUHUB

[එකොළොස්වැනි පිටුව බලන්න

0000790

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024**
**General Certificate of Education (Adv. Level) Examination, 2024**

**කෘෂි විද්‍යාව II**
**விவசாய விஞ்ஞானம் II**
**Agricultural Science II**

**08 S II**

## B කොටස - රචනා

**උපදෙස් :**

- ✳ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
- ✳ අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.
  (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය **150** කි.)

**5.** (i) බීජ මගින් ශාක ප්‍රචාරණය කිරීමේ වාසි හා අවාසි සඳහන් කරන්න.

(ii) නිර්පාංශු වගාවේ ගැඹුරු පෝෂණ ධාරා තාක්ෂණය (Deep Flow Technique) රූපසටහනක් ඇසුරෙන් විස්තර කරන්න.

(iii) ශාකයක උත්ස්වේදනයට බලපාන අභ්‍යන්තර සාධක විස්තර කරන්න.

**6.** (i) බෝග ක්ෂේත්‍රවල ජල වහනය දියුණු කිරීම සඳහා යොදා ගන්නා ජල වහන ක්‍රම සුදුසු රූපසටහන් ඇසුරෙන් විස්තර කරන්න.

(ii) රූපාකාර හා වාසස්ථාන මත පදනම් ව වල්පැළ වර්ගීකරණය විස්තර කරන්න.

(iii) කෘෂි පාරිසරික කලාප වෙන්කිරීමේ වැදගත්කම විස්තර කරන්න.

**7.** (i) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය කෙරෙහි උඩරට වැව්ලි ක්ෂේත්‍රයේ බලපෑම විස්තර කරන්න.

(ii) කෘමීන් හා මයිටාවන් අතර සමානතා හා අසමානතා පැහැදිලි කරන්න.

(iii) පැසවීම මගින් ආහාර පරිරක්ෂණය කරන අයුරු පැහැදිලි කරන්න.

**8.** (i) එළදෙනකගේ කිරි අස්වැන්නට හා සංයුතියට බලපාන සාධක විස්තර කරන්න.

(ii) පලතුරු හා එළවලු අස්වනු නෙළීමේ දී පරිණත දර්ශක භාවිතයේ වැදගත්කම පැහැදිලි කරන්න.

(iii) පසේ ආම්ලිකතාව ඇතිවීමට බලපාන හේතු හා බෝගවලට එහි ඇති බලපෑම විස්තර කරන්න.

**9.** (i) නිෂ්පාදන සාධක නම් කර, ඒවායේ ඵලදායිතාව වැඩි කිරීම සඳහා උපාය මාර්ග **දෙක** බැගින් සඳහන් කරන්න.

(ii) කොම්පෝස්ට් සෑදීමේ ක්‍රියාවලියට බලපාන සාධක විස්තර කරන්න.

(iii) බෝග වගා කිරීම සඳහා මූලික බිම් සැකසීමේ ප්‍රධාන පියවර විස්තර කරන්න.

**10.** (i) සහල් වෙළෙඳපළ සමතුලිතතාව සඳහා බලපාන සාධක විස්තර කරන්න.

(ii) වාසි අවාසි සඳහන් කරමින්, බිත්තර දමන කිකිළියන් නිදැලි ක්‍රමයට හා සූක්ෂම ක්‍රමයට ඇති කිරීම සන්සන්දනය කරන්න.

(iii) උඩරට ගෙවතු වගාවේ වැදගත්කම විස්තර කරන්න.

✳✳✳

Visit EDUHUB

# ORDER A/L TERM TEST PAPERS, SHORT NOTES, WORKBOOKS & REVISION BOOKS

**SINHALA, ENGLISH & TAMIL MEDIUM**



# LOL BOOK STORE

**CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE**

Visit EDUHU

**0717774440 (WHATSAPP)**

**WWW.LOL.LK**